ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 අගෝස්තු 30 වැනි දින |

**වාහන ආනයනය සඳහා වාණිජ බැංකු සමග විවෘත කරනු ලබන ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතාවය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානයට ලක්ව ඇති පරිදි, 2013 වර්ෂය තුළ වෙළෙඳ හවුල්කාර ආර්ථිකයන් බොහොමයක ව්‍යවහාර මුදලේ අගය ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව තියුණු ලෙස අවප්‍රමාණය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ රථවාහන ආනයන සීඝ්‍රයෙන් ඉහළ යාමේ අවදානමක් පවතී. මෙම තත්ත්වය අඛණ්ඩව පැවතීමට ඉඩ නොදිය යුතු බවත්, ඒ සඳහා නිසි ප්‍රතිචාර දැක්විය යුතු බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වාසයයි.

මෙම පසුබිම යටතේ මතුවිය හැකි අවදානම් තත්ත්වයන්ට මුහුණ දීම සඳහා මුදල් මණ්ඩලය විසින් 2013 අගෝස්තු මස 27 වැනි දින පැවති එහි රැස්වීමේදී බස් රථ, ගිලන් රථ, ලොරි සහ ට්‍රක්රථ හැර අනෙකුත් මෝටර් රථ ආනයනය සඳහා වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට සියයක ආන්තික තැන්පතු අවශ්‍යතාවයක් පැනවීමට තීරණය කරන ලදී. ඒ අනුව, වහාම ක්‍රියාත්මක වන පරිදි නම් කරන ලද රථවාහන කාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කළ හැකි වනුයේ සියයට සියයක අවම මුදල් ආන්තිකයක් පවතී නම් පමණි.

මෙම ආන්තිකය පැනවීම පිළිබඳව මාස 06 ක කාලපරිච්ඡේදයකට පසුව නැවත සලකා බැලීමට ද මුදල් මණ්ඩලය තීරණය කරන ලදී.